## ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

### 01. මූල්‍ය ප්‍රකාශන

### 1:1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1:2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 1:2:1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ප්‍රමිත 09 ට අනුව රු.5,239,980 ක් වූ මාස 03 ට වැඩි ස්ථාවර තැන්පතු මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණි.

(ආ) ප්‍රමිත 16 ට අනුව සේවක පාර්තෝෂික ගෙවීම සඳහා රු.62,717,094 ක මුදලක් වෙන්කර තිබුණද එම මුදල සඳහා ආයෝජනයක් කර නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2006 - 2010 දක්වා කාලපරිච්ඡේදය තුළදී මිලදී ගන්නා ලද රු.952,160 ක පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ස්ථාවර වත්කම් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට මෙම තොගයේ පොත් අගය රු.576,288 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටද මෙය නිවැරදි කිරීමට හෝ පොත් වලින් ලියා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේදී නිම වූ කෞතුකාගාර ඉදිකිරීම් ව්‍යාපෘතිය හා ඊට සම්බන්ධ තවත් ව්‍යාපෘති 15 ක කටයුතු නිම වී ඇතත් දීර්ඝ කාලයක සිට කෙරිගෙන යන වැඩ ගිණුමේ දක්වා තිබූ අතර රු.50,166,931 ප්‍රාග්ධනීත කිරීමට ක්‍රියාකර නොතිබුණි.

(ඇ) රු.5,961,229 ක් වටිනා සත්දින ඇමතුම් තැන්පතු සහතික 07 ක් හා රු.200,000 ක වටිනාකමැති ස්ථාවර තැන්පතු 02 ක් බැංකු ඇපකර ලෙස තබා ඇතත්, ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) නර්ඩ් මධ්‍යස්ථානය සතු යන්ත්‍ර සූත්‍ර වල වටිනාකම රු.111,770,056 ක් වූ අතර රු.1,517,633 ක අළුතවැඩියා වටිනාකමක් ඇති යන්ත්‍රයක් පමණක් ප්‍රත්‍යාගනනය කර තිබුණි.මෙම යන්ත්‍රය ප්‍රත්‍යාගණනය කිරීමට පදනමක් හෝ කමිටුවකින් සිදු කිරීම වෙනුවට එම අංශයෙ ප්‍රධානියා විසින්ම සිදු කර තිබුණි.

(ඉ) තාක්ෂණ උද්‍යාන ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම සඳහා දරන ලද රු.77,827 ක පුනරාවර්තන වැය ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි.

### 1.2.3 <u>ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා වෙනත් ණයගැති ගිණුමේ ශේෂය රු.11,403,421 ක් වූ අතර වර්ෂ 5-8 ත් අතර කාලයක් පැරණි ශේෂය රු.5,542,695 ක් විය.තවද වර්ෂ 3-5 ත් අතර රු.592,665 ක හිඟ ණය ශේෂයක්ද, වර්ෂ 1-3 ත් අතර රු.618,261 ක හිඟ ණය ශේෂයක්ද විය.

(ආ) රු.2,060,329 ක් වූ වෙළඳ ණයහිමි ශේෂය තුල අවුරුදු 4ට වැඩි රු.128,730 ක ශේෂයක්ද විය.

(ඇ) 2004 වර්ෂයේ සිට හිරියාල ආර්ථික මධ්‍යස්ථානයෙන් අයවිය යුතු රු.5,130,260 ක් ද ඇසසර් නෙට්වර්ක් සමාගම වෙතින් අයවිය යුතු රු.197,625 ක්ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිරවුල් කර නොතිබුණි.

(ඈ) මධ්‍යස්ථානය විසින් විවිධ ව්‍යාපෘති සඳහා සේවාදායකයින්ගෙන් ලබාගෙන ඇති රු.10,837,474 ක අත්තිකාරම් මුදල් වර්ෂ ගණනාවක සිටම නොපියවා ඇති අතර, ඉන්වොයිස් නිකුත් නොකිරීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතු වී ඇති බව නිරීක්ෂණය විය. මෙම ශේෂය තුළ වර්ෂ 5 කට වැඩි ශේෂ රු.67,500 ක්ද, වර්ෂ 3-5 අතර ශේෂ රු.496,498 ක්ද , වර්ෂ 01 වැඩි ශේෂ රු.141,426 ක්ද විය.

(ඉ) සේවයෙන් ඉවත් වූ නිලධාරීන් 24 දෙනෙකු සඳහා පාරිතෝෂික ගෙවීම සඳහා දීර්ඝ කාලයක සිට රු.807,818 ක් වෙන්කර තිබූ අතර, එම මුදල නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි

1.2.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| <u>විෂයය</u> | <u>වටිනාකම (රු)</u> | <u>ඉදිරිපත් නොවූ සාක්ෂි</u> |
|---|---|---|
| ස්ථාවර වත්කම් | 444,965,739 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ණයහිමියෝ | 2,060,329 | අදාල පාර්ශවයන් විසින් ශේෂ සනාථ කිරීම් |
| ණයගැතියෝ | 11,403,421 | |
| සත්දින ඇමතුම් තැන්පතු | 5,961,229 | තැන්පතු සහතික |
| ස්ථාවර තැන්පතු | 200,000 | |

1.2.5 <u>නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| <u>නීති,රීති රෙගුලාසි වලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 570 | තැන්පත් කළ දින සිට වර්ෂ දෙකක කාලයක් තුළදී හිමිකම් නොපාන ඉකුත් තැන්පතු ආදායමට ගත හැකි වුවත් රු.32,800 ක් වටිනාකමැති ආපසු ගෙවිය යුතු තැන්පත් ආදායමට ගැනීමට කටයුතු ක ර නොතිබුණි. |
| (ආ) 2009 මැයි 26 දිනැති හා අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යවසාය දෙපා. චක්‍රලේඛයේ 8.3.3 ඡේදය | සමාලෝචිත වර්ෂයේ දිරිදීමනා ගෙවීම සඳහා මධ්‍යස්ථානය රු.1,568,786 ක් වැයකර තිබුණද, උක්ත චක්‍රලේඛය ප්‍රකාර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2009 නොවැම්බර් 13 දින රාජ්‍ය මුදල් චක්‍රලේඛ 438(2) අ(i), (ii), (iii) , (iv) මු.රෙ.756,756(4) 771(2) | මධ්‍යස්ථානය සතු රු.6,136,266 ක වටිනාකමැති අපහරනය කළයුතු තොග සම්බන්ධයෙන් චක්‍රලේඛයේ දෙවන ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2004 ජුනි 29 දින හා අංක පීඑඩී 25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 2006 ජුනි 27 දිනැති රාජ්‍ය මුදල් අංක පීඑෆ්/පීඊ/9 | අදාල අමාත්‍යවරයාගේ එකගතාවය හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව රු.2,600,748 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |

1.2.6 <u>ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

මධ්‍යස්ථානයට ගනුදෙනුකරුවන් විසින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් තැන්පත් කර ඇති රු.64,809,474 ක මුදලක් 2004 වර්ෂයේ සිට සත්දින ඇමතුම් තැන්පත් වල ආයෝජනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය රු. 24,792,432 ක ඌණතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූපී ඌනතාවය රු. 6,249,543 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල වල රු. 18,542,889 ක ඌනතාවයේ වැඩිවීමක් දක්නට ලැබුණි. මෙයට බලපෑ ප්‍රධාන හේතු වූයේ පෞද්ගලික පඩි නඩි මිලියන 12 කින් වැඩිවීමත් පර්යේෂණ හා සංවර්ධන වියදම් මිලියන 6 කින් වැඩිවීමත් වේ.

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>කාර්ය සාධනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) <u>සිවිල් අංශය</u>**

2011 වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මට අනුව සිවිල් අංශය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති 12 ක් සඳහා රු. 2,940,000 ක් ඇස්තමේන්තුගත කර තිබුණු අතර, එම ව්‍යාපෘති 2011 වර්ෂය තුළදී ආරම්භ කර නොතිබුණි.

(i) ක්‍රියාකාර සැලැස්මට අනුව සිවිල් අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළදී නිපුණතා පුහුණු වැඩ සටහන් පැවැත්වීමෙන් රු. 8,800,000 ක්ද අඩු වියදම් තාක්ෂණ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් රු. 10,000,000 ක්ද ඉපැයීමට අපේක්ෂිත වුවද, මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම නිසා අපේක්ෂිත ආදායම් ලැබී නොතිබුණි.

(ආ) තාක්ෂණ අලෙවි අංශය

--------------------------

| | ඉලක්කය | ඉලක්කය කරා ළඟා නොවීම |
|---|---|---|
| (i) | දිවයින පුරා නිවාස සැලසුම් ශිල්පීන් 80 ක් පත් කිරීම | සැලසුම් ශිල්පීන් පත්කර නොතිබුණි. |
| (ii) | විදාතා මධ්‍යස්ථානවල දැනුවත් කිරීමේ වැඩසටහන් 06ක් පැවැත්වීම. | දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා නොතිබුණි. |
| (iii) | විදාතා මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් 4 ක් පැවැත්වීම. | පුහුනු වැඩසටහන් පවත්වා නොතිබුණි. |
| (iv) | විදාතා ප්‍රදර්ශන 10 කට සහභාගිවීම. | ප්‍රදර්ශන සඳහා සහභාගී වී නොතිබුණි. |
| (v) | විදාතා සම්පත් මධ්‍යස්ථානවල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා නොතිබුණි. |

(vi) ඉංජිනේරු කෞතුකාගාරය

| | |
|---|---|
| ළමා උද්‍යාන පහසුකම් සැලසීම | ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නැත |
| කෞතුකාගාර දේශනාගාරය නවීකරණය කිරීම | නවීකරණ කටයුතු සිදු කර නොතිබුණි. |
| කෞතුකාගාරය සඳහා උපදෙස් පත්‍රිකාවක් සකස් කිරීම හා දේශනාගාරය විවෘත කිරීම | උපදෙස් පත්‍රිකාව සකස් කර නොතිබුණු අතර විවෘත කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි. |

(ඇ) කෘෂිකාර්මික හා පසු අස්වනු නාශක අංශය

| ඉලක්කය | ඉලක්කය කරා ළඟා නොවීම |
|---|---|
| ජීව ඉන්ධන මගින් ක්‍රියාකරන ශීතාගාරය වැඩි දියුණු කිරීම | ආහාර කල්තබා ගැනීම සඳහා ජීවවායු ශිතකරන කාමරයක් සැදීම ව්‍යාපෘතියේ අරමුණ වු අතර ව්‍යාපෘතිය ආරම්භ කර නැත. |
| හතු කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා ජීව වායුව යොදා ගැනීම | රු.433,343 ඇස්තමේන්තුගත අගයක් වු මෙම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. |
| පොල් වගාව සඳහා පොහොර යෙදීම පිණිස යන්ත්‍රයක් හඳුන්වා දීම | රු.248,912 ක පිරිවැයක් දරා උපකරණය සකස් කරන ලද අවශ්‍යතාවයට නුසුදුසු බව නිරීක්ෂණය විය. |
| තනි රෝදයේ ට්‍රැකටරය ප්‍රචලිත කිරීම | රු.474,308 ක පිරිවැයක් දරා උතුරු නැගෙනහිර ප්‍රචලිත කිරීම නියම වු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළද සාර්ථක නොවීය. |
| පෙරසවි අංගනයක් සඳහා වානේ කම්බි ආතති ගැන්වීමේ හයිඩ්‍රොලික් යන්ත්‍රය නිපදවීම | රු.770,792 ක් වැයකර යන්ත්‍රය සැදුවද මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි. |

(ඇ) පුනර්ජන බලශක්ති අංශය

-----------------------------

| ඉලක්කය | ඉලක්කය කරා ළඟා නොවීම |
|---|---|
| ජීව ඉන්ධන මගින් ක්‍රියාත්මක වන මධ්‍යම ප්‍රමාණයේ තාපකය වැඩි දියුණු කිරීම | ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. |
| අන්තරාදායක අපද්‍රව්‍ය හා රෝහල්වල අපද්‍රව්‍ය සඳහා දාහකාගාරයක් නිර්මානය කිරීම හා සංවර්ධනය කිරීම | ව්‍යාපෘති වැඩ කටයුතු ආරම්භ කර නොතිබුණි. |
| තේ වියලීම සඳහාඩීසල් මගින් ක්‍රියාත්මක වන පෝරනුවක්, දැව ඉන්ධන මගින් ක්‍රියා කරවීම | - එම - |
| දැව කැබලි කරන යන්ත්‍රයක් නිර්මානය කිරීම | එම |

## 3.2 කළමණාකරන අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ඉන්ධන වශයෙන් දැව භාවිතා කරන විදුලි උත්පාදන පද්ධතියක් ක්‍රියාත්මකකර විදුලිය නිපදවා ජාතික විදුලිය පද්ධතියට සම්බන්ධ කිරීම

---------------------------------------------------------------------------------------------------

(i) ඉන්ධන වශයෙන් දැව භාවිතා කරන විදුලි බල උත්පාදන පද්ධතියක් ක්‍රියාකර විදුලිය නිපදවීම හා එය ජාතික විදුලි පද්ධතියට සම්බන්ධ කර එමගින් විදුලිය සඳහා වැය වන වියදම අවම කර ගැනීම ව්‍යාපෘතියේ අරමුණ විය. 2004 වර්ෂයේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය අදියර 02 ක් යටතේ ක්‍රියාත්මක වී 2011 දෙසැම්බර් 31 දින වන විට රු.32,913,445 ක් වැය කර තිබුණද, මෙතෙක් ව්‍යාපෘතියේ අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ මුල් කාර්තුවේදී විදුලි උත්පාදන පද්ධතියේ අළුත්වැඩියා කටයුතු නිම කර තිබු අතර නොවැම්බර් මාසයේදී ජනනය කළ විදුලිය පර්යේෂණ මට්ටමින් ජාතික විදුලි පද්ධතියට සම්බන්ධ කර තිබුණද, මෙම යන්ත්‍රයෙන් විදුලිය නිපදවීම සඳහා දිනකට පිරිවැය රු.24,480 ක් වැනි ඉහල අගයක් ගෙන තිබුණි. නිපදවනු ලබන විදුලිය ජාතික විදුලි බල පද්ධතියට සම්බන්ධ කිරීමෙන් දිනකට රු.33,300 ක ආදායමක් ලබාගත හැකි බව මධ්‍යස්ථානයේ සභාපතිවරයා විගණනයට දැනුම් දී තිබුණද ඒ බව සනාථ කරන ලද ගිවිසුමක් හෝ වෙනත් ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් නොවීය.

(iii) දේශිය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නර්ඩ් මධ්‍යස්ථානයට ආපසු ප්‍රතිපූර්ණය කරගතහැකි රු.29,358,044 ක් වු එකතු කළ අගය මත බදු මුදල දීර්ඝ කාලයක සිට අය කරගෙන නොතිබුණි

(ආ) ව්‍යාපෘති වලින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම

| ව්‍යාපෘතිය | දරන ලද වියදම | නිරීක්ෂණ |
|---|---|---|
| | රු. | |
| සාලියපුර වැඩිහිටි නිවාසය සඳහා ජීව වායු ජනකයක් සෑදීම | 1,898,088 | ව්‍යාපෘතියේ අරමුණ වූ ජීව වායුව නිපදවීම සිදු නොවීම |
| කෙසෙල් ප්‍රවාහනයේදී සිදුවන හානිය අවම කිරීම | 855,782 | කෙසෙල් ප්‍රවාහනයේදී සිදුවන හානිය අවම කිරීම සඳහා මල්ලක් නිපදවීම ව්‍යාපෘතියේ අරමුණ වුවද මේ සඳහා නිපදවූ මල්ල ගොවීන් අතර ප්‍රචලිත වී නොතිබුණි. |

(ඇ) 2007 හා 2010 වර්ෂවලදී ආරම්භ කළ රු.2,637,857 ක් පිරිවැය දැරූ ව්‍යාපෘති 04 ක් පර්යේෂණ වියදම් ලෙස ගිණුම් වලින් ලියාහැර තිබුණද පර්යේෂණවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත නොහැකි වී තිබුණි. ඇතැම් ව්‍යාපෘති තාවකාලිකව අත්හැර දමා තිබු අතර විධිමත් පරිදි අවසන් කර නොතිබුණි.

(ඈ) විදුලි ලාම්පු සම්බන්ධයෙන් අංක 2002:1231 හා 2002:.1225 යන ශ්‍රී ලංකා ප්‍රමිතීන් වල 4.6 ඡේදය අනුව විදුලි ලාම්පු පැය 2000 ක ආයුකාලය පසු කිරීමෙන් නිකුත් කරන කාර්ය සාධන පරීක්ෂණ වාර්තා ලබාගැනීම සඳහා සාම්පල 801 ක් භාරදී තිබුණද කාර්ය සාධන වාර්තා 02 ක් පමණක් නිකුත් කර තිබුණි.

(ඉ) තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා නර්ඩ් මධ්‍යස්ථානය වෙත ලැබුණු විදුලි ලාම්පු 338 න් කාර්ය සාධන වාර්තා නිකත් කර තිබුණේ 14 ක් සඳහා පමණි.

(ඊ) විදුලි ලාම්පු පරීක්ෂණ වාර්තා ලබාගැනීමේ ප්‍රධාන සේවාදායකයා වන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නියැදීන් සඳහා ඉන්වොයිසියක් නිකුත් කිරීමට මාස 4-19 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.

(උ) (i) මධ්‍යස්ථානයට කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් ලිපිකරුවෙකු 2007 වර්ෂයේදී විනය විරෝධී ක්‍රියාවක් හේතුකොටගෙන සේවයෙන් ඉවත් කර තිබුණි. එම සේවකයා කම්කරු විනිශ්වය සභාවේ පැවැරූ නඩුවක තීන්දුවට අනුව සේවයෙන් ඉවත් කළ දින සිට නැවත සේවයේ පිහිට වූ දිනය දක්වා වන්දි ලෙස රු.587,406 ක් ගෙවීමටත්, එම සේවකයා නැවත සේවයේ පිහිටුවීමටත් මධ්‍යස්ථානයට සිදුවිය. මෙහිදී කළමනාකරණය විසින් 2000 සැප්තැම්බර් 01 දින සිට කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයා සේවයෙන් ඉවත් කරන ලද 2007 අගෝස්තු 20 දින දක්වා වරින්වර කොන්ත්‍රාත් කාල සීමාව අඛණ්ඩව දීර්ඝ කර තිබුණි. මෙය කළමනාකරණයේ දුර්වලතාවය නිසා සිදුවූවක් නොවන බවත්, නඩු තීන්දුව අනුව වන්දි ගෙවීමට සිදුවූ බවත් සභාපතිවරයා දන්වා ඇත.

(ii) ආයතනයේ නීති උපදෙස් සඳහා නීති උපදේශකවරුයකු බඳවාගෙන තිබූ අතර නීති උපදේශකවරයෙකු සිටයදීත් මධ්‍යස්ථානයට නඩු සඳහා වන්දි ගෙවීමට සිදු වී තිබුණි. 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අග දක්වා නීති උපදේශකවරයාට නඩු ගාස්තු වලට අමතරව රු.1,179,000 ක් නීති උපදෙස් සඳහා ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා පමණක් රු.153,000 ක් ගෙවා තිබුණි.

(ඌ) ආයතනයේ නිලධාරියෙකු බැදුම්කර කඩකිරීම වෙනුවෙන් ලැබුණු රු.2,290,988 ක බැදුම්කර ආදායම සත්දින ඇමතුම් තැන්පතුවල තැන්පත් කර තිබුණි. එම මුදල ඊට වැඩි ප්‍රතිලාභ ලැබෙන ස්ථාවර තැන්පතුවල අතිරික්ත භාර අරමුදලේ ආයෝජනය කිරීම සම්බන්ධව අවධානය යොමු කර නොතිබුණි.

(එ) 2011 දෙසැම්බර් 31 දිනට ප්‍රදාන/සම්මාන වෙන් කිරීමේ ගිණුමේ ශේෂය රු.1,083,995 ක් වූ අතර, වාර්ෂිකව ඉංජිනේරුවරුන්ට පිරිනමනු ලබන පර්යේෂණ හා සංවර්ධන සම්මාන/ප්‍රදාන 2010 හා 2011 වර්ෂවලදී පිරිනමා නොතිබුණි.

(ඒ) සේවාදායකයින් විසින් රඳවා ගැනීමේ බදු නොගෙවීම නිසා මධ්‍යස්ථානය විසින් රු.5,555 ක් ගෙවා තිබුණි.

## 3.3 හඳුනාගත් පාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පරිපාලනයේදී සිදු වූ දෝෂයක් හේතුකොටගෙන මධ්‍යස්ථානයේ සේවකයෙකු මධ්‍යස්ථානයට විරුද්ධව පැවරූ නඩුවකින් එම සේවකයාට වන්දි ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.587,406 ක් ගෙවීමට සිදු වී තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට වගකීම් පැවරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නිම වූ වාණිජ ව්‍යාපෘති පරීක්ෂාවේදී එම වාණිජ ව්‍යාපෘති 7ක් ක්‍රියාත්මක කිරීමෙන් මධ්‍යස්ථානයට රු.440,165 ක අලාභයක් සිදු වී තිබුණි. ව්‍යාපෘති වලින් ලැබූ ආදායම ඉක්මවා වියදම් දැරීමට සිදු වී තිබුණ.

(ඇ) 2006 වර්ෂයේදී ඩීඑම්එස්/30 වැටුප් පරිවර්තනයට අනුව වැටුප් ගෙවීමේදී වැඩිපුර ගෙවා ඇති රු.57,176 ක මුදල කොටස් වශයෙන් අය කර ගන්නා බව සභාපතිවරයා දන්වා ඇත.

## 3.4 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කෝප්පායි වල විදාතා මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සමඟ 2010 වර්ෂයේදී රු.5,370,965 ක කොන්ත්‍රාත් අගයකට ගිවිසුමක් අත්සන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.448,343 ක පිරිවැයක් දරා තිබූ අතර, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා තිබුණි.

(ආ) මධ්‍යස්ථානයට පද්ධති සහතික (ISO -9001) හඳුන්වාදීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.110,100 ක් වැය කර පුහුණු වැඩසටහන් පවත්වා ඇතත් ISO -9001 සහතිකය ලබාගෙන නොමැති අතර එම වියදම ආර්ථික නොවූ ගනුදෙනුවක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) රු.11,283,085 ක් වැය කර 2008,2009,2010 වර්ෂවල ආරම්භ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති 14 ක් සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති කටයුතු අවසන් කර ඇතත් ව්‍යාපෘති වල අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. ඇතැම් ව්‍යාපෘති වලින් සාර්ථක ප්‍රතිඵලයක් ලබාගැනීමට නොහැකිව තිබූ අතර, අවසන් කල මෙම ව්‍යාපෘති නැවත වරක් අළුත් ව්‍යාපෘති සේ ආරම්භ කිරීමට පියවර ගෙන ඇති අතර එය කාලෝචිත නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.5 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

2011 දෙසැම්බර් 31 දිනට පොදු තොගයෙන් (General) 40% ක් නියෝජනය වු චලනය නොවන තොග රු.5,815,981 ක් ද හානි වු තොග රු.320,285 ක්ද අවුරුදු 07 කට වඩා වැඩි කාලයක සිට ගබඩාවේ නිෂ්ක්‍රියව තිබුණි.

3.6 <u>මධ්‍යස්ථානය සතු සම්පත් වෙනත් රාජ්‍ය ආයතන සඳහා මුදාහැරීම</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සඳහා කරවෙඩ්ඩි ප්‍රදේශයේ විදාතා මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් නර්ඩ් මධ්‍යස්ථානයේ ශ්‍රමය හා පොදු කාර්ය වියදම් දැරීමට එකඟ වී තිබු අතර ඇස්තමේන්තුගත වියදම රු.3,194,626 ක් විය.නිලධාරීන්ගේ හා කම්කරුවන්ගේ ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලෙස ඇස්තමේන්තු කර තිබු මුදල රු.930,450 ක් වු අතර සත්‍ය වශයෙන් දරන ලද මුදල රු.1,957,358 ක් විය. මෙය ඇස්තමේන්තු ගත වියදමින් 110% ක වැඩි වීමකි.

(ආ) අමාත්‍යාංශය සමඟ අත්සන් කරන ලද ගිවිසුමට නර්ඩ් මධ්‍යස්ථානය දරනු ලබන වියදම ඇතුළත් කර නොතිබුණි.

3.7 <u>මානව සම්පත් කළමණාකරණය</u>

ඉංජිනේරුමය පර්යේෂණ කිරීම් මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යය වුවද එම කාර්යයන් ඉටු කරලීම සඳහා අනුමත තනතුරු 38 ක් පුරප්පාඩුව පවතී.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| පර්යේෂණ විද්‍යාර්ථී | 05 | 03 | 02 |
| ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු | 13 | 08 | 05 |
| ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු | 16 | 01 | 15 |
| පර්යේෂණ ඉංජිනේරු | 21 | 15 | 06 |
| පාලක - තාක්ෂණ උද්‍යාන | 01 | - | 01 |
| - කෞතුකාගාරය | | | |

| | | | |
|---|---|---|---|
| - නඩත්තු | 01 | - | 01 |
| - කම්හල | 01 | - | 01 |
| | 01 | - | 01 |
| කාර්මික නිලධාරී | 05 | 02 | 03 |
| කාර්මික සහකාර | 15 | 12 | 03 |
| | | | ----- |
| | | | 38 |
| | | | === |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත නිරීක්ෂණ සිදු කෙරිණි.

(i) කළමනාකරණ විගණන චක්‍රලේඛ ඩීඑම්ඊ/2009(1) අංක හා 2009.06.09 දිනැති චක්‍රලේඛයේ 07 ඡේදයට අනුව වාර්ෂික විගණන සැලැස්ම පිළියෙල කිරීමේදී වාර්ෂික ඇස්තමේන්තුව, ක්‍රියාකාරී සැලැස්ම, අයවැය යෝජනා ආදී සෑම අංශයකම කටයුතු ආවරණය වන පරිදි සකස් කළයුතු වුවත් එපරිදි සකස් කර නොතිබුණි.

(ii) උක්ත චක්‍රලේඛයේ 07 ඡේදයට අනුව ආයතනය තුළ ඵලදායී කාර්ය සාධනයක් තහවුරු කිරීම සඳහා මූල්‍ය විගණනයට අමතරව, පද්ධති විශ්ලේෂණය, කාර්යසාධන විශ්ලේෂණය සහ විශේෂ විමර්ශන අංශ කෙරෙහි විගණන අංශය අවධානය යොමු කළයුතු වුවත් එම අංශ කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර පාලනය

නර්ඩ් මධ්‍යස්ථානයේ ELE/COM/59/11 ව්‍යාපෘතිය යටතේ ආනයනික වාහන බැටරි සාම්පල ලබාගැනීම වැඩ ඇණවුම් සටහන් කිරීම, ඉන්වොයිස් කිරීම, පරීක්ෂාවන් සිදු කිරීම, වාර්තා සකස් කිරීම, වාර්තා නිකුත් කිරීම, නියැදින් ආපසු ලබාදීම ආදී සියළුම කාර්යයන් එකම නිලධාරියෙකු මගින් සිදු කරන බැවින් ලැබෙන ආදායම් උපරිම කර ගැනීමට හෝ සිදු වියහැකි වැරදීම් වලක්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 **විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2003 ජුනි 02 දිනැති හා පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ 7:4:1 වගන්තිය ප්‍රකාර අවම වශයෙන් මාස 3 කට වරක්වත් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා තිබුණේ විගණන කමිටු 03 ක් පමණි.

(ii) 2010 දෙසැම්බර් 14 දිනැති හා අංක 55 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ 5 ජේදය ප්‍රකාර විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකුගේ සේවය ලබාගැනීම අත්‍යාවශ්‍ය බව දැක්වුවද විගණන කමිටු රැස්වීම් සඳහා එම නියෝජිතයින් සහභාගි කරවා ගෙන නොතිබුණි.

05. **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මධ්‍යස්ථානයේ සභාපති වෙත යොමු කරන ලදී.පහත දැක්වෙන පාලන කෙෂත්‍ර කෙරෙහි අවධානය යොමුවිය යුතුය.

(අ) ව්‍යාපෘති පිරිවැයකරණය හා කළමනාකරණය

(ආ) ණයගැතියෝ හා ණයහිමියෝ